# ළමා ඇඳ ඇතිරිල්ලකට සුදුසු ව්‍යාප්ත මෝ්තරයක් නිර්මාණය

- ✓ **නිපුණතාව - 3.0**

පාරිභාරික අවශ්‍යතා සඳහා නිර්මාණකරණය

- ✓ **නිපුණතා මට්ටම -3.2**

රෙදිපිළි සඳහා ව්‍යාප්ත සැරසිලි නිර්මාණය



# වයාප්ත මෝස්තර

## ***වයාප්ත මෝස්තරයක් යනු ?***

ඉතා සංවිධානාත්මකව ක්‍රමවත්ව සකසකන ලද මෝස්තර ඒකකයක් නැවත නැවත යෙදීමෙන් අඛණ්ඩ සම්බන්ධතාවක් ගොඩනැගෙන ලෙස සැකෙසන මෝස්තර වේ.ඒ අනුව වයාප්ත මෝස්තර යනු සකස් කරගන්නා ලද මෝස්තර ඒකකයක් නිදහසේ පැතිරවීම පමණක් නොව රෙදි පිළි සදහා යෙදෙන අවස්ථාවල මුද්‍රණයට පහසුවන ලෙස සැලසුම් විය යුතුය.

## මෝස්තර ඒකකය ව්‍යාප්ත කළ හැකි ආකාර

මෝස්තර ඒකකය ව්‍යාප්ත කිරීමේ දී නැවත නැවත ඇඳීම කළ යුතුය.

එය සිදු කළ හැකි ආකාර බොහෝමයකි.

පාරිභාරික අවශ්‍යතාවය මත සුදුසු ආකාරයක් තෝරාගැනීම සිදු කළ යුතුය.

ඒ අනුව මෝස්තර ඒකකයේ ප්‍රමාණය තීරණය කිරීම කළ යුතුය

## මෝස්තර නිර්මාණය කිරීමේ දී සැලකිය යුතු කරුණු

- තේමාවට උචිත සැරසිලි ඒකකයක් නිර්මාණය කිරීම.
- නිර්මාණාත්මක හැඩ හෝ ස්වාභාවික හැඩ ආශ්‍රය කර ගැනීම.
- අවශ්‍යතාවය අනුව සැලසුම් කිරීමේ දී ජ්‍යාමිතික උපකරණ භාවිත කිරීම.
- ඔබ විසින් ඇඳින ලද ඒකක අතුරින් එක් ඒකකයක් තෝරාගෙන ට්‍රේසින් කඩදාසියක් ආධාරයෙන් ඩ්‍රෝවින් කඩදාසියේ පිටපත් කිරීම.

- තේමාවට උචිත අයුරින් වර්ණ දැමීම
- (සැරසිලි කිරීමේ දී පාරම්පරික සැරසිලි හෝ නවතම සැරසිලි සඳහා සම්ප්‍රදායට අනුව සැරසිලි කිරීම)
- ක්‍රමානුකූල බව, පිරිසිදු බව රැකෙන සේ චිත්‍රය ඇඳීම

**ව්‍යාප්ත මෝස්තරයක් නිර්මාණය පියවර කිහිපයක් යටතේ සිදු කළ හැකිය**

- සැලසුම් කිරීම
- මෝස්තර ඒකකයක් නිර්මාණය කිරීම
- එම ඒකකය ක්‍රමවත්ව ව්‍යාප්ත කිරීම
- වර්ණ කිරීම

- ඒ අනුව ළමා ඇඳ ඇතිරිල්ලක් නිර්මාණය කිරීමේ දී කුඩා දරුවන්ට උචිත මෝස්තර ඒකක යොදා ගත යුතුය.









- පහත දැක්වෙන්නේ එසේ යොදාගත හැකි තවත් ඒකක කීපයකි.












©michelle perkett studio









**ක්‍රියාකාරකම-**

- ඉහත රූප අධයයනය කර ඇද ඇතිරිල්ලක් සදහා සුදුසු නිර්මාණයක් කරන්න.